# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

ග්‍රාමීය සංවර්ධන , සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය
கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சு
Ministry of Rural Development, Social Security and Community Empowerment


| මගේ අංකය<br>எனது இல<br>My No | DSD/HO/07/SD/04(පරිසර) | ඔබේ අංකය<br>உமது இல<br>Your No | ........................ | දිනය<br>திகதி<br>Date | 2025.05.21 |
|---|---|---|---|---|---|

සියළුම දිස්ත්‍රික් ලේකම්/අතිරේක අධ්‍යක්ෂ ජනරාල්

සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්

සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්

සියළුම නියෝජ්‍ය සහකාර අධ්‍යක්ෂවරුන්

**<u>ජගත් පරිසර දින සැමරුම් වැඩසටහන-2025/ජුනි/05</u>**

ඉහත මැයෙන් යුතුව ජනාධිපති ලේකම්තුමා විසින් සියළු ආයතන ප්‍රධානීන් වෙත එවන ලද පරිසර චක්‍රලේඛ-ps/fea/circular/2025 හා2025/05/14 දිනැති ලිපිය හා බැදේ.

02. 2025-ලෝක පරිසර දිනය “Ending plastic pollution” යන ගෝලීය තේමාව යටතේ සැමරීම සඳහා කටයුතු සංවිධානය කරමින් පවතින බව එම ලිපිය මගින් අවධාරනය කර ඇත. ගෝලීය වශයෙන් ප්ලාස්ටික් මගින් සිදුවන දූෂණයට අවසන් විසඳුමක් ලබා ගැනීමේ අපේක්ෂාවෙන් ප්ලාස්ටික් දූෂණයට එරෙහිව සටන් කිරීම සඳහා එමගින් සාමූහික ක්‍රියාමාර්ගයක් අපේක්ෂා කරයි.

03. සීඝ්‍රයෙන් ඉහල යන ප්ලාස්ටික් භාවිතය තිරසාර සංවර්ධනයේදී පාරිසරික සමාජයීය ආර්ථික හා සෞඛ්‍යය මානයන් කෙරෙහි අහිතකර ලෙස බලපාන බරපතල ගෝලීය පාරිසරික ගැටළුවක් බවට පත්වී ඇති බවත් මිනිස් පරිභෝජන රටාව තුල ප්ලාස්ටික් භාවිතය අත්‍යාවශ්‍ය අංගයක් බවට පත්වී ඇති බවත් එම ලිපිය මගින් අවධාරණය කර ඇත.

04. එබැවින් භාවිතා කරන ලද ප්ලාස්ටික් අපද්‍රව්‍ය විවිධ ක්‍රමවලින් පරිසරයට මුදා හැරීම නිසා පාරිසරික දූෂණය වර්ධනය වී ඇති බවත් මේ නිසා “පිරිසිදු පරිසරයක් යහපත් ජන ජීවිතයක්” උදාකර ගැනීම සඳහා පරිසරය සුරකින එහි තිරසරභාවය පවත්වා ගැනීම සඳහා පරිසරයට ආදරය කරන සමාජයක් බිහිකිරීම ප්‍රධාන අපේක්ෂාව වශයෙන් සළකා මේ සඳහා සුදුසු වැඩසටහන් සංවිධානය කළයුතු බවත් ඉහත ලිපිය අවධාරණය කර ඇත.


1වන අදියර,4 වන මහල , සෙත්සිරිපාය , බත්තරමුල්ල. / 1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல / 1st Step, 4 th floor, Sethsiripaya Battaramu

| | අධ්‍යක්ෂ ජනරාල්<br>பணிப்பாளர் தலைமையதிபதி<br>Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන)<br>மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்)<br>Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී<br>பிரதான கணக்காளர்<br>Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)<br>பணிப்பாளர் (குறு நிதி )<br>Director (Micro Finance) | කාර්යාලය<br>அலுவலகம்<br>Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2869824 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dgsamurdhi@gmail.com | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | Hot Line :0112-889007 | | Hot Line:0112-885582 | Hot Line: 011- 2887 |

05. වර්තමාන රජයේ ප්‍රමුඛ වැඩසටහනක් වන "Clean Sri Lanka" වැඩසටහනේ පරිසර කුළුණ යටතේ පරිසරය සුරක්ෂිත කරන සමාජයක් බිහිකිරීම ප්‍රධාන අපේක්ෂාව වේ. ඒ සඳහා විවිධ ක්‍රියාකාරකම් ජනතාවගේ සහභාගිත්වයෙන් ඉටුකිරීමට අපේක්ෂා කෙරේ. ලෝක පරිසර දිනයේ තේමාව හා එක්වෙමින් පරිසරය හා මානව සෞඛ්‍යය දැඩි ලෙස තර්ජනයට ලක් කර ඇති ප්ලාස්ටික් භාවිතය හා අනිසිලෙස අපද්‍රව්‍ය බැහැර කිරීම පිළිබඳ එහි විශේෂ අවධානයක් යොමු කර ඇත. එමගින් දැනට මුහුණ දෙන පාරිසරික අභියෝගවලට සාර්ථකව මුහුණදීම සඳහා පුද්ගලයින්ගේ ජීවන රටාවේ වෙනසක් ඇති කරමින් පස්වැදෑරුම් සංකල්ප හඳුන්වාදෙමින් තිරසාර ජීවන රටාවකට හුරු කෙරේ.

06. මෙම ආකල්ප තුළින් ප්ලාස්ටික් හා පොලිතින් නිෂ්පාදකයාගේ සිට ඒවා පරිහරණය කරන අවසාන පාරිභෝගිකයා දක්වා පරිසර හිතකාමී නිෂ්පාදන දිරිගැන්වීම සහ අවභාවිතය අඩුකිරීම, නිවැරදිව බැහැර කිරීම, ප්‍රතිචක්‍රීයකරණයට යොමු කිරීම, විකල්ප භාවිතය දිරිගැන්වීම හා දැනුවත් කිරීමෙන් සියළු පුරවැසියන් පරිසරය සුරැකීම සඳහා පෙළඹවීමට ජගත් පරිසර දිනය සුවිශේෂී අවස්ථාවක් ලෙස සළකා සැමරීම සිදුකළ යුතු අතර එම ක්‍රියාවන්ගේ තිරසාර පැවැත්මක් කෙරෙහි ද දැඩි අවධානයක් යොමු කළයුතු බව ඉහත ලිපියෙහි සඳහන් කර ඇත.

07. මෙම සියළු කරුණු සැළකිල්ලට ගනිමින් "ජගත් පරිසර දින සැමරුම් වැඩසටහන" මැයෙන් යුතුව පවත්වන ජාතික උත්සවයට සමගාමීව "ජාතික පරිසර සතිය" ප්‍රකාශයට පත්කර ඇත. එම සතිය තුළ දී අදාල දිනයට නියමිත තේමාවන් ඉටුකර ගැනීම සඳහා අප දෙපාර්තමේන්තුවට අදාල කර ගත හැකි වැඩසටහන් ජනාධිපති ලේකම්තුමාගේ පරිසර චක්‍රලේඛ-ps/fea/circular/2025 පරිදි සංවිධානය කර ඉටුකරනලෙස කාරුණිකව දන්වා සිටිමි.

මැයි 30 -ප්ලාස්ටික් අපද්‍රව්‍ය කළමනාකරණ දිනය
මැයි 31 -වායු දූෂණය හා එහි අහිතකර බලපෑම් අවම කිරීමේ දිනය
ජුනි 01 - පරිසර පවිත්‍රතාවය පිළිබඳව දැනුවත් කිරීමේ දිනය
ජුනි 02 - ජෛව විවිධත්ව සංරක්ෂණ දිනය
ජුනි 03 - ජලය හා ජල මූලාශ්‍ර සංරක්ෂණ දිනය
ජුනි 04 -වෙරළ කලාප පවිත්‍ර කිරීමේ දිනය
ජුනි 05 - රුක්රෝපණ හා ජගත් පරිසර දින සැමරුම

08. ඒ අනුව පහත සඳහන් වැඩසටහන් හැකි පමණින් සංවිධානය කර එම සතිය තුළදී ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

I. මෙම දෙපාර්තමේන්තුවට අයත් සියළු ආයතනවල ප්ලාස්ටික් භාවිතාවෙන් සිදුවෙන හානි පිළිබඳව හා ඒ වෙනුවට යොදාගත හැකි විකල්ප පිළිබඳ දැනුවත් කිරීම. ජීවන රටාවේ වෙනසක් ඇති කරමින් ප්ලාස්ටික් භාවිතයගැන නැවත සිතීම (Re-think) ප්‍රතික්ෂේප කිරීම(Refuse) අඩුකිරීම (Reduce) නැවත භාවිතා කිරීම(Reuse) හා ප්‍රතිචක්‍රීය කරණය කිරීම (Recycle) යන සංකල්ප හඳුන්වා දෙමින් තිරසාර ජීවන රටාවකට හුරු කිරීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම කළ යුතුව ඇත.

II. ප්ලාස්ටික් ක්‍රමවත්ව බැහැර කිරීම සඳහා පරිසරය පවිත්‍ර කිරීම, ඉවත දමනලද ප්ලාස්ටික් පොලිතින් එකතුකිරීම, කසළ වර්ගීකරනය හා කසළ කළමණාකරනය සඳහා පළාත් පාලන ආයතනවල සහයෝගයෙන් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, සඳහා අපගේ මැදිහත්වීම ලබාදීමට අවධානය යොමු කළ යුතුය.

III. නිවසේදී හා කාර්යාලයේදී ඉවත දමන ලද ප්ලාස්ටික් එකතු කර ඒවා කසළ එකතු කරන මධ්‍යස්ථානවලට යොමු කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

IV. පොදු ස්ථාන අලංකාර කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

V. හානියට පත් භූමි නැවත සැකසීම, පාංශු සංරක්ෂණය හා තිරසර ඉඩම් කළමණාකරනය සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

VI. ජලපෝෂක රක්ෂිත ප්‍රදේශ ගංගා ඉවුරු තෙත්බිම් ප්‍රදේශවැනි පරිසර සංවේදී භූමි හඳුනාගැනීම හා ඒවා සංරක්ෂණය සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

VII. වෙරළ ආශ්‍රිත කලාපතුල ප්ලාස්ටික් පොලිතීන් භාවිතය අවම කිරීම.

VIII. රුක්රෝපණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

ඉහත යෝජිත සුදුසු පරිසර සංරක්ෂණ වැඩසටහන් ජාතික පරිසර සතිය තුළදී ඉටුකිරීම සඳහා පූර්ව සැලසුම් සකස්කර දේශපාලන නායකත්වයේ හා ප්‍රජා සහභාගිත්වයෙන් ඉටුකිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස කාරුණිකව දන්වා සිටිමි.

## II කොටස - රුක්රෝපණ වැඩසටහන හා ජගත් පරිසර දින සැමරුම

ඉහත චක්‍රලේඛය අනුව ජුනි 05 දින මේ සඳහා වෙන් කර ඇත. ඒ අනුව පසු ගිය වසරේදී මෙන් මෙම වසරේද ජගත් පරිසර දිනය තේමා කර ගනිමින් දිවයින පුරා සියළු දිස්ත්‍රික්කවල රුක් රෝපණ හා පරිසර වැඩසටහන් සිදු කිරීමට අවශ්‍ය කටයුතු සංවිධානය කළ යුතුව ඇත. 1972 ජුනි මස 05 වන දින සිට 16 දින දක්වා ස්වීඩනයේ ස්ටෝක් හෝම්ස් නුවර පැවති මානව පරිසරය සුරැකීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ සමාරම්භක දිනය සනිටුහන් කිරීම සඳහා සෑම වසරකම ජුනිමස 05 වන දින ජගත් පරිසර දිනය ලෙස ප්‍රකාශයට පත් කර ඇත.

එතැන් සිට දශක 05කට වැඩි කාලයක් ලෝක වාසී ජනතාව දැනුවත් කිරීමට හා දිනෙන් දින පැන නගින ගෝලීය පරිසර ගැටළු පිළිබඳව ලෝක නායකයින් හා ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ අවධානය යොමු කිරිමේ අරමුණින් ජගත් පරිසර දිනය සමරනු ලබයි. ශ්‍රී ලංකාව තුලද භූමිය හා පරිසරය සුරැකීම පිළිබඳ සැලකීමේදී කරුණු කීපයක් කෙරෙහි අවධානය යොමු කිරීමට සිදුවී ඇත. එබැවින්පරිසරය සුරක්ෂිත වන අරමුණු සහිතව අපගේ ඉදිරි වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම යුගයේ අවශ්‍යතාවයක් වී ඇත.

1. විවිධ මානව ක්‍රියාකාරකම් හේතුවෙන් අවදානමට ලක්වන පරිසරයේ සමතුලිත බව රැක ගැනීම කෙරෙහි අවධානය යොමු කිරිම.
2. දේශගුණික විපර්යාස වලට අනුහුරු වීම.
3. ජීව විශේෂ වඳ වී යාමේ තර්ජනයට පිළියම් යෙදීම.
4. ආහාර සුරක්ෂිතාවය ඉහළ නැංවීම.
5. පිරිසිදු පානීය ජලය ලබා ගැනීම.
6. ජීවනෝපායයන් පරිසර හිතකාමී ලෙස වැඩි දියුණු කිරිම

මෙම අරමුණු සාක්ෂාත් කර ගැනිම සඳහා මෙම දෙපාර්තමේන්තු විෂය පථයට අදාලව රුක් රෝපණ වැඩ සටහන ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සංවිධානය කරණ ලෙස කාරුණිකව දන්වමි. ඒ අනුව 2025/ජුනි/05 දිනට යෙදෙන රුක්රෝපණ වැඩසටහනට අදාල ප්‍රාදේශීය සංවිධානයක්ම ආවරණය වන පරිදි සංවිධානය කර ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගන්න.

- **කාල රාමුව**

ඉහත දින සෑම ප්‍රාදේශීය සංවිධානයක්ම නියෝජනය කරමින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ තෝරා ගත් ස්ථානයක පැල සිටුවීමෙ සමාරම්භක වැඩසටහන ආරම්භ කිරීම. අනතුරුව එදින සිට පැල සිටුවීමේ වැඩසටහන් පැවැත්වීම.

- **ක්‍රියාත්මක කරන ස්ථාන**

සියළුම ප්‍රාදේශීය බල ප්‍රදේශ ආවරණය වන පරිදි වගා කිරීමට සුදුසු හිස් භූමි තෝරා ගත යුතුය. (රාජ්‍ය හා පෞද්ගලික)ඇල. දොළ. ඉවුරු ජල පෝෂක ප්‍රදේශ. සුසාන භූමි වැනි ප්‍රදේශ සුදුසු වේ.

- **මූල්‍ය ප්‍රතිපාදන වෙන් කිරීම**

එක් එක් සංවිධානය නියෝජනය කරමින් පැල 50ක් මිලදී ගැනීමට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන අදාල ප්‍රජා මූල සංවිධානවල එකඟතාවය මත ලබා ගත හැකිය. මීට අමතරව කෙටි උත්සව සභාවක් පැවැත්වීම සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ලබා ගත හැකිය.

- **ක්‍රියාත්මක කරණ ආයතනය**

ප්‍රාදේශීය ප්‍රජාමුල සංවිධානය හා ප්‍රජාමූල සමිති මගිනි. මේ සෑම අවස්ථාවකදීම රජය විසින් නිකුත් කර ඇති චක්‍රලේඛ උපදෙස් හා මූල්‍ය රෙගුලාසි වලට අනුව කටයුතු කරණ ලෙස වැඩි දුරටත් දන්වමි.

- **සිටුවීමට අපේක්ෂිත පැල වර්ග**

දිගුකාලීන ආර්ථික වටිනාකමක් ඇති පැල වර්ග සපයා ගැනීම සුදුසුය. උදා.(මැහෝගනී,කොස්,බුරුත,නැදුන්,කළුවර) ආදිය. එසේම කෙටි කාලීන ආර්ථික ප්‍රතිලාභ ලබා දෙන පලතුරු බෝග/ඖෂධ පැල යනාදිය, ජලපෝෂක ප්‍රදේශ සංරක්ෂණයට උචිත පැල වර්ග(මී.කුඹුක් ආදිය) වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව හරහා අදාල දිස්ත්‍රික්ක හා ප්‍රාදේශීය සංවිධාන පැල වර්ග සපයා ගත යුතුයි. බෙහෙත් හා පලතුරු වැනි ශාක බහුලව තිබෙන ප්‍රදේශවලින් ඒවා නොමැති ප්‍රදෙශවලට ලබාදීම. ප්‍රයෝජනවත් වන පැල වර්ග හුවමාරු කර ගැනීම වැඩ සටහන ක්‍රියාත්මක කිරීමේදී වැදගත්වේ. පැල සිටුවීමෙන් පසු පැලයේ වර්ධනය තෙක් රැක බලා ගැනීම අවශ්‍ය වේ.

මෙම වැඩසටහන්වල තිරසාරභාවය පවත්වාගෙන යාම සඳහා ආයතනමට්ටමින් සුදුසු වැඩසටහන් මාසිකව ද කාර්තුමය වශයෙන්ද ක්‍රියාත්මක කළයුතු බව දන්වා ඇත. මෙම කාර්යයන් සිදුකිරීමේදී රජය විසින් නිකුත්කර ඇති චක්‍රලේඛ ප්‍රතිපාදන අනුව ක්‍රියා කළයුතු බව දන්වමි.

මෙම සියළු වැඩසටහන්වල ප්‍රගතිය socialdev@samurdhi.gov.lk විද්‍යුත් ලිපිනයට යොමුකරනු ලෙස කාරුණිකව දන්වා සිටිමි.

පරිසර සංවේදී ප්‍රජාවක් බිහිකිරිමේදී මහඟු පරිසරයක දායකත්වය අද්විතීය කාර්යයක් ඉටුකරනු බැවින් එවැනි සංවේදී පරිසර ප්‍රජාවක් බිහිකිරීම සඳහා ඔබ දක්වන සහයෝගය ඉතා අගයකොට සළකමී.

සී.ඩී.කළුආරච්චි
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්

01. ජනාධිපති ලේකම්, ජනාධිපති ලේකම් කාර්යාලය, කොළඹ - කා.දැ.ගැ.පි
02. ලේකම්, ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය- කා.දැ.ගැ.පි
03. සියළු අංශ ප්‍රධානීන් ,සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - දැ.ගැ.පි